**ඒ. ඒ. සිරිසිංහ එ. මහජන බැංකුව**

RTIC Appeal (**පුද්ගලික වශයෙන් විභාග කිරීම**)/ 1236/2019 (2019.08.20 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ කිශාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අභියාචක** - ඒ. ඒ. සිරිසිංහ
**නොතිසි ලත් පාර්ශවය** - නම්කළ නිලධාරී, මහජන බැංකුව

**පෙනීසිටීම**
අභියාචක - ඒ. ඒ. සිරිසිංහ, නිලංග පෙරේරා, නීතිඥ
පොදු අධිකාරිය - තරංගා අඹේපිටිය නීති නිලධාරිනී

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | **2017.07.20** |
| තොරතුරු නිළධරයා තීරණය ලබා දුන් දිනය | **2018.07.25** |
| නම් කල නිළධරයා වෙත අභියාචනය යොමු කළ දිනය | **2018.08.31** |
| නම් කල නිළධරයා තීරණය ලබා දුන් දිනය | **2018.10.09** |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | **2018.10.31** |

**අභියාචනයට පසුබිම්වූ කරුණු:**

අභියාචක 2018.07.20 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා සිටි බව පවසා සිටින ලදී. (මෙම තොරතුරු ඉල්ලීමෙහි පිටපතක් කොමිෂන් සභාවට සිදු කරන ලද අභියාචනයට අභියාචක අමුණා නොමැත.)

1. *2009.09.06 සිට 337 - 2002 චක්‍ර ලේඛනය අනුව එතෙක් පැවති ක්‍රමය වෙනස් කිරීමට දුන් උපදෙස් අඩංගු වූ අධ්‍යක්ෂක මණ්ඩලයේ පත්‍රිකාවේ සහතික කරන ලද පිටපතක්*
2. *වර්ෂ 2002 දී 337/2002 දරණ චක්‍රලේඛනය නිකුත් කරද්දී සක්‍රිය සේවයේ සිටි, 2009.08.06 දිනට විශ්‍රාම යාමේ හේතුව මත ඉහත කී වාසිය අහිමිවූ සේවකයින් ලෙස දැනට ජීවත්ව සිටින පිරිස සහ ඔවුන් සඳහා පහත සඳහන් තොරතුරු*

*a. නම*
*b. සේවා අංකය*
*c. ලිපිනය*
*d. ප්‍රථමවරට 3-III විභාගය සමත් වූ වර්ෂය*
*e. සක්‍රීය සේවකයින්ට සමානව උසස්වීම් පසුදාතම් කළහොත් ඒ ඒ සේවකයා සඳහා වැටුප් වශයෙන් දැරීමට සිදුවන මාසික පිරිවැය මහජන බැංකුවේ සාමාන්‍යධිකාරී විසින් මහජන පෙත්සම්කාරක සභාවට යොමුකරන ලද 2013 ඔක්තෝම්බර් 24 දිනැති වාර්තාවේ පිටපතක්.*

*3. 2015.04.09 වැනි දින මහජන පෙත්සම් කාරක සභාව මගින් මෙම උසස්වීම් පසුදාතම් කිරීම පිළිබඳව පැවැත්වූ පරීක්ෂනයට ඉදිරිපත් කළා යයි බැංකුව විසින් අභියාචක වෙත එවූ 2017.08.22 දින දරණ ලිපියේ සඳහන් 2013.10.24 දින දරන වාර්තාව*

තොරතුරු නිලධරයා 2018.07.25 දිනැතිව ප්‍රතිචාර දක්වමින් පොදු අධිකාරිය පනතේ 5 වගන්තිය ප්‍රකාරව තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කරන ලදී. ඒ අනුව අභියාචක 2018.08.31 දිනැතිව නම්කළ නිලධරයා වෙත අභියාචනයක් යොමු කරන ලදී. නම්කළ නිලධරයා 2018.10.09 දිනැතිව ප්‍රතිචාර දක්වමින් 5 (1) (අ), 5 (1) (ඈ) සහ 5 (1) (උ) වගන්ති ප්‍රකාරව තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කරන ලදී. මෙම ප්‍රතිචාරයෙන් අතෘප්තියට පත් අභියාචක 2018.10.31 දිනැතිව කොමිෂන් සභාවට අභියාචනයක් ඉදිරිපත් කරන ලදී.

**අභියාචනය සලකා බලන අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

පොදු අධිකාරිය විසින් 2019.08.08 දිනැති ලිඛිත දේශන මගින් පහත පරිදි සඳහන් කර සිටින ලදී.

*අයිතම අංක 1-*

*ඉල්ලා ඇති තොරතුරු පැහැදිලි නොවේ. කෙසේ වුවද අධ්‍යක්ෂ මණ්ඩල සන්නිවේදන රහසිගත වන අතර, බඳවා ගැනීම් සහ උසස් වීම් වලට අදාළ තොරතුරු ලබා දීම මගින් බැංකු ශේත්‍රයට අහිතකර ලෙස බල පෑ හැකිය. තවද වාණිජමය රහස්‍යභාවයට සහ තරඟකාරීත්වයට බලපෑම් ඇති කරයි. ඒ අනුව පනතේ 5 (1) (ඈ) සහ 5 (1) (උ) වගන්ති ප්‍රකාරව තොරතුරු ලබා දිය නොහැකිය.*

*අයිතම අංක 2-*

*ඉල්ලා ඇති තොරතුරු පැහැදිලි නොවේ. තවද විශ්‍රාම ගොස් ඇති ජීවතුන් අතර සිටින පුද්ගලියින්ට අදාළව ඉල්ලා ඇති තොරතුරු තබා ගැනීමට පොදු අධිකාරිය බැඳී නොසිටියි. කෙසේ වුවද ඉල්ලා ඇති තොරතුරු පෞද්ගලික් තොරතුරු වන අතර සහ භාරකාර සම්බන්ධතාවයක් පවතින බැවින් පනතේ 5 (1) (අ) සහ 5 (1) (උ) වගන්ති ප්‍රකාරව තොරතුරු ලබා දිය නොහැකිය.*

*අයිතම අංක 3-*

*ඉල්ලා ඇති තොරතුරු පැහැදිලි නොවේ. කෙසේ වුවද පෙනී යන්නේ මෙම තොරතුර අමාත්‍යංශ ලේකම්වරයා විසින් ලබා දෙන ලද වාර්තාවක් බවයි. මෙම වාර්තාව සැකසීම සඳහා ලබා දී ඇති කවර හෝ තොරතුරක් රහසිගත වන අතර භාරකාර සම්බන්ධතාවය අනුව ලබා දිය නොහැකිය. බඳවා ගැනීම් සහ උසස් වීම් වලට අදාළ තොරතුරු ලබා දීම මගින් බැංකු ශේත්‍රයට අහිතකර ලෙස බල පෑ හැකිය. තවද වාණිජමය රහස්‍යභාවයට සහ තරඟකාරීත්වයට බලපෑම් ඇති කරයි. ඒ අනුව පනතේ 5 (1) (ඈ) සහ 5 (1) (උ) වගන්ති පරකාරව තොරතුරු ලබා දිය නොහැකිය.*

*තවද අභියාචක විසින් 2017.08.04 දිනැති තොරතුරු ඉල්ලීම මගින් සමාන තොරතුරු ඉල්ලා ඇති අතර එයට ප්‍රතිචාර වශයෙන් ලැබුණු 22.08.2017 දිනැති ලිපිය පදනම් කොටගෙන මෙම අභියාචනය පවත්වාගෙන හා නොහැකිය. මේ සම්බන්ධයෙන් අභියාචනයක් යොමු කිරීමට ප්‍රමාද වීම සම්බන්ධයෙන් අභියාචක කරුණු දක්වා නොමැත.*

විභාග කිරීම සඳහා දෙපාර්ශ්වයම පැමිණ සිටි අතර, එම අවස්ථාවේදී කොමිෂන් සභාවේ අවධානය යොමු වූයේ මෙම අභියාචනය මගින් ඉල්ලා ඇති ඇතැම් තොරතුරු පදනම් ව බී. ඒ. රුවන්පතිරණ එ. මහජන බැංකුව (RTIC Appeal 303/2018, 2018.12.11) නමින් තවත් අභියාචනයක් කොමිෂන් සභාව වෙත යොමුව තිබූ අතර, පනතේ 32 (1) වගන්තිය ප්‍රකාරව නියමිත කාල පාරසයන් තුළ එම අභියාචනය යොමු කිරීමට අපොහොසත් වීම හේතුවෙන් එය නිෂ්ප්‍රභා වූ බවයි.

පොදු අධිකාරිය වෙනුවෙන් පෙනී සිටි නිලධාරිනිය මෙම අභියාචනය සම්බන්ධයෙන් දැනුවත් නොවන බැවින් කල් අයැද සිටියාය.

**නියෝගය**

බී. ඒ. රුවන්පතිරණ එ. මහජන බැංකුව (RTIC Appeal 303/2018, 2018.12.11) අභියාචනය (ඇමුණුම 1), පනතේ 32 (1) වගන්තිය ප්‍රකාරව නියමිත කාල පාරසයන් තුළ එම අභියාචනය යොමු කිරීමට අපොහොසත් වීම හේතුවෙන්, පොදු අධිකාරිය විසින් ගෙන එන ලද විරෝධතාවය පදනම් කොට ගෙන සහ එම ප්‍රමාද වීම, පනතේ 32 (2) වගන්තිය ප්‍රකාරව අභියාචකට පාලනය කළ නොහැකි හේතුවක් මත සිදු වූවක් ලෙස තහවුරු කිරීමට නොහැකි වූ බැවින්අවසන් වූ බව අභියාචකගේ අවධානයට ගෙන එනු ලැබේ. පොදු අධිකාරිය විසින් ගොනු කර ඇති ලිඛිත දේශන වලට මෙම නියෝගය ලැබී සති දෙකක කාලයක් තුළ ප්‍රතිචාර දැක්වීමට අභියාචක වෙත නියෝග කරනු ලැබේ.

අභියාචනය කල් තබනු ලැබේ.

මීළඟ විභාග කිරීමේ දිනය: 2019.11.13

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.

******